සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - I

නම / විභාග අංකය : ......................................................................................... කාලය පැය 01 යි.

විශේෂ උපදෙස් :

- ★ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතය.
- ★ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් පිළිපදින්න.
- ★ සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

- අංක 1 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

(1) පෘථිවිය සූර්යයාට වඩාත් ඈතින් පිහිටන්නේ ................................ මාසයේ දී ය.
(ජනවාරි / ජූලි / දෙසැම්බර්)

(2) වායුගෝලයේ ඇති වායු වර්ග අතුරින් වැඩිම ප්‍රතිශතයක් ඇත්තේ ................................................ ය.
(ඔක්සිජන් / නයිට්‍රජන් / කාබන්ඩයොක්සයිඩ්)

(3) ශ්‍රී ලංකාවේ වයඹ දිග හා ගිනිකොණ දිග පිහිටි පටු බිම් තීරු දෙක ........................... දේශගුණික කලාපයට අයත් ය.
(අර්ධශුෂ්ක / පහතරට තෙත් / වියළි)

(4) උතුරු ඇමරිකාවේ 'සැක්‍රමැන්ටෝ' නිම්නය වැදගත් වන්නේ ........................... වගාව සඳහායි.
(තිරිඟු / බාර්ලි / වී)

(5) නගරයක් වටා උපනගර වර්ධනය වීමෙන් ................................................ නිර්මාණය වේ.
(නගරයාය / පුරවරය / නාගරික සමූහිකය)

(6) කරුමුල්, කයිරුමුල්, වායුධර මුල් වලින් සමන්විත මූල පද්ධතියකින් යුත් ශාක ........................... නමින් හඳුන්වයි.
(සැවනා / කඩොලාන / පයිනස්)

(7) ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ................................................ අජීවී සංරචකයකි.
(වියෝජකයින් / සූර්ය ශක්තිය / ශාක)

(8) කඳුවැටි විහිදෙන දිශාවට සමාන්තරව විහිදෙන නිම්නය ........................................ ලෙස හඳුන්වයි.
(තීර්යක් නිම්නය / පටු නිම්නය / ආයතගාමී නිම්නය)

(9) රබර් වගාව සඳහා යෝග්‍ය වන්නේ ................................................ ය.
(කබොක් මිශ්‍ර රතු පස / ලැටරයිට් පස / වැලි පස)

(10) තෙත් බිම් සංරක්ෂණය හා කළමනාකරණය අරමුණින් පිහිටුවාගෙන ඇත්තේ ........................... සම්මුතියයි.
(මොන්ට්‍රියල් / රැම්සාර් / රියෝ)

- අංක 11 සිට 20 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

(11) ඕස්ට්‍රේලියාවේ වාසය කරන ආදිවාසී ජන කොට්ඨාසය ඇබොරිජින් නමින් හඳුන්වයි. (නි / වැ)

(12) මධ්‍යධරණී කෘෂිකර්මයෙහි ලා වැදගත් යුරෝපීය රටක් ලෙස ප්‍රංශය සැළකේ. (නි / වැ)

(13) ආයතගාමී නිම්න හා තීර්යක් නිම්නවලින් යුත් ප්‍රදේශයක ජලවහන රටාව ශාඛීය හැඩයක් ගනී. (නි / වැ)

(14) අත්ලාන්තික් සාගරයේ විහිදෙන මධ්‍ය සාගරික වැටි කලාපය භූමිකම්පා බහුල කලාපයකි. (නි / වැ)

(15) ආනයන අපනයන වැනි යුගල අගයන් දැක්වීමට ද්විත්ව තීරු ප්‍රස්තාරය වඩා යෝග්‍ය වෙයි. (හි / වැ)

(16) තට්ටු නිවාස ඉදිකිරීම නිසා නගරයක සිරස් නිවාස ව්‍යාප්තිය අවම වේ. (හි / වැ)

(17) යුරෝපීය රටවල්, ආසියාව හා ඕස්ට්‍රේලියාව සමඟ සූවස් ඇළමාර්ගය මගින් සම්බන්ධ කරයි. (හි / වැ)

(18) භූමි පරිභෝග සිතියමක් තේමා සිතියම් වර්ගයට අයත් වේ. (හි / වැ)

(19) ශ්‍රමිකයාට පූර්ණ භාණ්ඩයක් තනිවම නිපදවිය හැකි වීම විශේෂ ප්‍රාගුණ්‍යයේ ඇති වාසියකි. (හි / වැ)

(20) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ පුමිතිරි අනුපාතයට අනුව පුරුෂයින්ගේ සංඛ්‍යාවට වඩා ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගනී. (හි / වැ)

- අංක 21 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

(21) පුත්තලම සිට මුලතිව් දක්වා වෙරළබඩ ප්‍රදේශවල .................................. අවධියට අයත් හුණුගල් තිබේ.

(22) රටක පිහිටීම අක්ෂාංශ දේශාංශ අනුව ප්‍රකාශ කිරීම .................................. පිහිටීම ලෙස හඳුන්වයි.

(23) බැසෝල්ට් .................................. පාෂාණයකට උදාහරණයකි.

(24) කඳුවැටි දෙකක් අතර පිහිටි පහත් ප්‍රදේශය .................................. නමින් හඳුන්වයි.

(25) බෑවුම් සහිත ප්‍රදේශවල .................................. ක්‍රමය යටතේ 'වී' වගා කරයි.

(26) බදුල්ල, මොණරාගල දිස්ත්‍රික්ක අයත් ප්‍රදේශය .................................. පළාත නමින් හඳුන්වයි.

(27) තුඩුව .................................. හු දර්ශනයේ දැකිය හැකි භෞතික ලක්ෂණයකි.

(28) උෂ්ණත්වයේ කාලීන වෙනස්වීම් .................................. ප්‍රස්තාරය මගින් පැහැදිලිව නිරූපණය කළ හැකියි.

(29) බෙංගාල බොක්ක ආශ්‍රිත කලාපීය සංවිධානය .................................. නමින් හඳුන්වයි.

(30) ලොව බහුලවම ඇතිවන ආපදාව වන්නේ .................................. යි.

- අංක 31 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.

(31) ඇමරිකා එක්සත් ජනපදයේ සිලිකන් නිම්නය උතුරු කැරොලිනාවේ පර්යේෂණ ත්‍රිකෝණය වඩාත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ

1. ගල් අඟුරු නිෂ්පාදනයට ය.
2. විද්‍යුත් නිෂ්පාදන කර්මාන්තයට ය.
3. යකඩ හා වානේ කර්මාන්තයට ය.
4. ගුවන්යානා නිපදවීමේ කර්මාන්තයට ය. ..........

(32) බ්‍රිතාන්‍යයේ යකඩ හා වානේ කර්මාන්ත ව්‍යාප්ත වී ඇති ප්‍රදේශයක් වන්නේ

1. ඔසාකා 2. පිට්ස්බර්ග්
3. කුමාමොටෝ 4. ලිවර්පූල් ..........

(33) සුළු අපනයන බෝගයක් වන කොකෝවා සඳහා ප්‍රසිද්ධ දිස්ත්‍රික්ක දෙක වන්නේ

1. කළුතර, ගම්පහ 2. මාතලේ, මහනුවර
3. මන්නාරම, මහනුවර 4. මාතලේ, කෑගල්ල ..........

(34) "සමක ප්‍රදේශයේ සිට ධ්‍රැව දෙසට ගලන ප්‍රවාහ උණුසුම් ප්‍රවාහ වේ." මීට උදාහරණ වන්නේ

1. අගුල්හාස් ප්‍රවාහය
2. කැලිෆෝර්නියානු ප්‍රවාහය
3. පේරු ප්‍රවාහය
4. බෙංගුවෙලා ප්‍රවාහය ...........

(35) දේශගුණික සාධකයක් ලෙස සැලකිය හැකි වන්නේ

1. වර්ෂාපතනය
2. සුළං
3. උච්චත්වය
4. උෂ්ණත්වය ...........

(36) වායුගෝලය, ජලගෝලය, ශිලාගෝලය යන තුන් කොටසේම අංග ඇතුළත් කලාපය හඳුන්වන නම කුමක්ද?

1. පරිවර්තී ගෝලය
2. අපරිවර්තී ගෝලය
3. ශිලා ගෝලය
4. ජෛව ගෝලය ...........


(37) සිතියමක මූලික අංගයක් නොවන්නේ මින් කුමක් ද?

1. හැඩය
2. දිශාව
3. අක්ෂර
4. ශීර්ෂය ...........

(38) නිවර්තන වර්ෂා වනාන්තර වල වැඩෙන ශාක කාණ්ඩය වන්නේ

1. තේක්ක, කොනිපරස්, කීන
2. තේක්ක, මැහෝගනි, හොර
3. මැහෝගනි, කේතුධර, කීන
4. මැහෝගනි, හොර, පයිනස් ...........

(39) "යාබදව දක්වා ඇත්තේ හූ ලක්ෂණ සිතියම් කොටසකි" එහි උන්නතාංශය අධ්‍යයනය කිරීමේදී ත්‍රිකෝණමිතික ස්ථානයේ අගය විය යුත්තේ මීටර




1. 1280 m
2. 1260 m
3. 1265 m
4. 1220 m ...........

(40) ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්කිරීමේදී ප්‍රබල දායකත්වයක් ලබාදෙන සාධකය වන්නේ

1. ගුවන්ගමන්
2. වෙළඳාම
3. සන්නිවේදන
4. බහුජාතික සමාගම් ...........

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - II

කාලය පැය 02 යි.

- මෙම ප්‍රශ්න පත්‍රය I, II, III වශයෙන් කොටස් තුනකින් සමන්විතයි.
- I කොටසේ 1 ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න දෙකකටත් III කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සැපයිය යුතුයි. පිළිතුරු දියයුතු මුල් ප්‍රශ්න සංඛ්‍යාව 5 කි.

---

### I කොටස

(1) (අ) • ඔබ වෙත සපයා ඇති 1:50 000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) සිතියමෙහි අංක 1 වශයෙන් දක්වා ඇත්තේ කුමක් දැයි වරහන තුළ දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න. (රළිබිම, ගල්පරය, වැලිබිම) (ලකුණු 01)

(ii) අංක 2 න් දක්වා ඇති වගාව කුමක් දැයි දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න. (තේ, පොල්, රබර්) (ලකුණු 01)

(iii) අංක 3 න් දක්වා ඇත්තේ කුමක්දැයි දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න. (හේන, ඉදිකළ ප්‍රදේශය, වෙනත් වගා) (ලකුණු 01)

(iv) අංක 4 මංසන්ධිය ආශ්‍රිතව ඇති පොදු ගොඩනැගිලි 2ක් ලියන්න. (ලකුණු 02)

(v) A, B, C යන ස්ථාන අතුරින් මුහුදේ වඩාත්ම ගැඹුරු ස්ථානය පෙන්වන අක්ෂරය කුමක් ද? (ලකුණු 01)

(vi) සිතියම් ප්‍රදේශයේ නැගෙනහිර අර්ධය නිරීක්ෂණය කරන විට ඔබට දක්නට ලැබෙන පරිපාලන මායිම කුමක්දැයි නම්කරන්න. (ලකුණු 01)

(vii) $A_2$ මහා මාර්ගයේ මුළු දිග කිලෝ මීටර් වලින් ලියා දක්වන්න. (ලකුණු 01)

(viii) සිතියම්ගත ප්‍රදේශයේ භෞතික හා මානව ලක්ෂණ අනුව D හා E ආශ්‍රිත ප්‍රදේශ ඇසුරින් කළ හැකි කර්මාන්ත 2ක් ලියන්න. (ලකුණු 02)

(ආ) • නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිතා කර පහත දී ඇති දෑ, සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් සමුළුව පැවැත්වූ ස්විට්සර්ලන්තයේ **නගරය.**

(ii) එක්සත් ජාතීන්ගේ 193 වැනි සාමාජිකයා ලෙස පිළිගත් දකුණු **සුඩානය.**

(iii) පෘථිවි පරිභ්‍රමණයේ දී ජුනි 21 වන දිනට හිරු මුදුන්වන **අක්ෂාංශය.**

(iv) නයිල් ගංගාවට පමණක් දෙවැනි වන ලෝකයේ දිගම **ගංගාව.**

(v) පෘථිවි පෘෂ්ඨය තුළ සිදු වූ විභේදයක් නිසා නිර්මාණය වූ **බයිකල්විල.** (ලකුණු 05)

(ඇ) • නිවැරදි සිතියම් විද්‍යාත්මක ශිල්පීය ක්‍රම භාවිතා කොට පහත දී ඇති දෑ, සපයා ඇති ලංකා සිතියමේ ලකුණුකර නම් කරන්න.

(i) එකවර විශාල ප්‍රමාණයේ මැණික් නිධියක් හමු වූ ස්ථානය. (මෙය ඌව පළාතේ පිහිටා ඇත.)

(ii) ලෝක උරුමයක් ලෙස යෝජනා වී ඇති රිටිගල දැඩි රක්ෂිතය.

(iii) ශ්‍රී ලංකාවේ පළමු වන අපනයන සැකසුම් කලාපය පිහිටි ස්ථානය.


(iv) ශ්‍රී ලංකාවේ 'තේ' පර්යේෂණායතනය පිහිටි නගරය.

(v) ශ්‍රී ලංකාවේ වැඩිම ග්‍රාමීය ජනසනත්වයක් ඇති දිස්ත්‍රික්කය (ලකුණු 05)


## II කොටස

(2) "අනාගතයේ දී, ජලය පිළිබඳ බරපතල ගැටළුවකට තුන්වන ලෝකයේ රටවල් මුහුණදෙන බව විද්‍යාඥයින්ගේ අදහසයි."

(i) රූපයේ දක්වා ඇති ජල චක්‍රයේ 1, 2, 3, 4 යන කොටස් නම් කරන්න. (ලකුණු 02)





(ii) ගොඩබිම ජලය පවතින ප්‍රධාන අවස්ථා තුන මෙම රූපයේ A, B හා C ලෙස දක්වා ඇත. ඒවා නම් කරන්න. (ලකුණු 03)




(iii) විවිධ මානව ක්‍රියාකාරකම් නිසා භූ තල ජල කොටස වේගයෙන් දූෂණය වෙමින් පවතී. එවැනි ප්‍රධාන මානව ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කොට ඒවා අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(3) "විවිධ භෞතික සමාජීය හා ආර්ථික සාධකවල බලපෑම අනුව ජනාවාස බිහිවේ."

A




B



(i) ඒ අනුව පහත දක්වෙන A සහ B ජනාවාස වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ජනාවාසයක් ඇති වීම හා වර්ධනය වීම කෙරෙහි බලපාන සාධක 3ක් ගෙනහැර දක්වන්න. (ලකුණු 03)

(iii) වත්මන් නාගරික ජනාවාසයක හඳුනාගතහැකි ගැටළු 3 ක් කෙටියෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 05)




4) (i) ඉහත සිතියමෙහි අංක 1 හා 2 න් තිරිඟු වගාකරන රටවල් දෙකක් ද අංක 3 හා 4 න් මස් හා කිරි පිණිස සතුන් ඇතිකරන රටවල් 2 ක්ද දැක්වේ. එම රටවල් හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉහත නම් කළ අංක 1 හා 2 රටවල තිරිඟු වගාවට හිතකර භූගෝලීය සාධක 2ක් ද අංක 3 හා 4 රටවල සත්වපාලනය කෙරෙහි බලපාන මානව සාධක 1 ක් ද සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) මෑතකාලීනව ලෝක වෙළඳපොළේ තිරිඟු පිටි හා සත්ව නිෂ්පාදන ද්‍රව්‍ය මිල ඉහළයාම කෙරෙහි බලපෑ හේතු 3 ක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

5) (i) පාංශු මහල් යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) පාංශු මහලක රූප සටහනක් ඇඳ එහි කොටස් නම්කරන්න. (ලකුණු 03)

(iii) පස වර්ධනය වීමට බලපාන සාධක 2ක් නම් කර, පස මිනිසාගේ පැවැත්ම සඳහා දායකවන අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)


## III කොටස

6) (i) (a) යාබද ලංකා සිතියමේ A ලෙස දක්වා ඇති කලාපයේ ඇති ප්‍රධාන ඛනිජ සම්පත හා ඒ ආශ්‍රිතව කෙරෙන ප්‍රධාන කර්මාන්තය නම් කරන්න. (ලකුණු 01)


(b) B ලෙස දක්වා ඇති වෙරළ ආශ්‍රිතව පිහිටි ඛනිජ සම්පත හා එම ප්‍රදේශයේ නම සඳහන් කරන්න. (ලකුණු 01)

(ii) "යාබද ලංකා සිතියමේ අංක 1 න් දක්වා ඇත්තේ වැඩිම වටිනාකමක් ඇති ඛනිජ වර්ගයයි" එම ඛනිජ වර්ගය හා ව්‍යාප්ත ප්‍රදේශය නම්කර ඉන් ලබාගත හැකි ප්‍රයෝජන පිළිබඳව කෙටියෙන් දක්වන්න. (ලකුණු 1+1+1)

(iii) ඛනිජ සම්පත් භාවිතයට ගැනීමේදී ඇතිවන පරිසර හානි අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග 3 ක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)



(7) 1981, 2001, 2021 (ප්‍රක්ෂේපිත) වර්ෂවල ජන සංඛ්‍යා දත්ත අනුව සැකසුණු ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා පිරමිඩ පහත දක්වා ඇත.




(i) (a) 1981 ජන සංඛ්‍යා පිරමිඩයේ වැඩිම ජන සංඛ්‍යාවක් ඇතුළත් වන වයස් කාණ්ඩය

(b) 2001 ජන සංඛ්‍යා පිරමිඩයේ වැඩිම ජන සංඛ්‍යාවක් ඇතුළත් වන වයස් කාණ්ඩය ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) 1981 ජන සංඛ්‍යා ව්‍යුහය 2021 ජනසංඛ්‍යා ව්‍යුහය හා සැසඳූ විට 2021 ජන සංඛ්‍යා ව්‍යුහයේ කැපී පෙනෙන වෙනස්කම් 3ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ජන සංක්‍රමණය නිසා සිදුවී ඇති වාසි හා අවාසි පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(8) (i) ස්වභාවික ආපදාවක් යන්න කෙටියෙන් අර්ථ දක්වන්න. (ලකුණු 02)

(ii) ස්වභාවික ආපදාවක් ලෙස නායයාමක් ඇතිවීමට පෙර අවට පරිසරයේ ඇතිවිය හැකි වෙනස්කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) නායයෑම් අවම කර ගැනීමට ඔබ යෝජනා කරන ක්‍රියාමාර්ග 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)


නම / විභාග අංකය / பெயர் / சுட்டெண் / Name / Index No. : ........................................................................................................................

# SRI LANKA 1:50,000 SHEET No. 91 - MATARA (PART OF)





II පත්‍රය - I කොටස (අ) ප්‍රශ්නය සඳහා / பேப்பர் II - பகுதி I (அ) வினா / Paper II - Part I (A) question

Name / Index No. :..............................................................................



Paper II - Part i (C) question

Name / Index No. : ........................................................................



Paper II - Part i (B) question